**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 435**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දොළොස්වැනි වාර්තාව

(2025.02.27 වැනි දින හා 2025.05.23 වැනි දින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාව)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින්
2026 ජනවාරි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2026 ජනවාරි මස 08 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින්*
*මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී*

## දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සංයුතිය

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම., ( 2025.05.08 දින සිට)
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., (2025.03.21 දින සිට.)
4. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම., (2025.05.20 දින සිට)
5. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම., (2025.03.21 දින සිට)
6. ගරු ඩී.වී. චානක මහතා, පා.ම., ( 2025.03.21 දින සිට)
7. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම., (2025.03.21 දින සිට)
8. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම., ( 2025.03.21 දින සිට)
9. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම., (2025.03.21 දින සිට)
10. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම., (2025.05.20 දින සිට)
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., (2025.03.21 දින සිට)
12. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., ( 2025.05.08 දින සිට)
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., (2025.03.21 දින සිට)
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම., (2025.03.21 දින සිට)
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම., (2025.05.08 දින සිට)
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., (2025.03.21 දින සිට)
22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,

24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම., (2025.03.21 දින සිට)
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., ( 2025.03.21 දින සිට)

**<u>කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය</u>**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- ප්‍රධාන නිලධාරි - එච්. රූපානි ද සොයිසා මිය
- නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. ලක්ෂාන් වික්‍රම මයා
- පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය
- පාර්ලිමේන්තු නිලධාරී - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය
- පාර්ලිමේන්තු නිලධාරී - එම්.එන්.පී. පෙරේරා මෙය

**<u>කාරක සභා වාර්තා</u>**

<u>www.parliament.lk</u> යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

<u>www.parliament.lk</u>

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

## පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ සටහන | V |
| 2. | විධායක සාරාංශය | VI |
| 3. | මූලාා ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 01 |
| 4. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් පරීක්ෂා කරන ලද ආයතනය<br>- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 02-29 |

## සභාපතිතුමාගේ සටහන

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරයේදී 2025.02.27 හා 2025.05.23 යන දෙදින තුළ පරීක්ෂාවට ලක් කළ විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022 සහ 2023 වර්ෂයන්ට අදාළ විගණකාධිපති වාර්තාව සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයින්ගේ ආරක්ෂාව හා සුභසාධනය ප්‍රධාන කොටගත් සුවිශේෂී අරමුණු 18කින් යුතුව 1994 අංක 04 හා 2009 අංක 56 දරන පනත් මඟින් සංශෝධිත 1985 අංක 21 දරන පාර්ලිමේන්තු පනත යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ස්ථාපිත කර ඇත. විදේශ සේවා නියුක්ති කාර්යාංශය ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය සඳහා වන මූලික නියාමන ආයතනය වේ. එය විදේශයන්හි රැකියා අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයින්ගේ අභිමානය, ආරක්ෂාව හා සමානාත්මතාවය යන කොන්දේසි යටතේ සංක්‍රමණය සහතික කරන ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා නීතිමය රාමුවක් යටතේ ස්ථාපිත පුළුල් විෂය පථයකින් යුත් ආයතනයකි.

කෙසේ වුවත් සිය විෂය පථයෙන් බැහැර වෙමින් නියාමන ආයතනයක් ලෙස නොව ශ්‍රමිකයන්ගේ සුබසාධනයද නොසලකා, කුමන හෝ ආකාරයකින් ශ්‍රමිකයන් විදේශගත කිරීමෙන් ආදායම් උපයන ආයතනයක් ලෙස මෙම ආයතනය ක්‍රියා කිරීමට තැත් කළ ආකාරය පිළිබඳව කාරක සභාවේදී අවධානය යොමු විය. එමෙන්ම පැවති දේශපාලන අධිකාරියේ අවශ්‍යතාවයන් මත ශ්‍රමිකයන්ට කිසිදු ප්‍රතිඵලයක් නොමැති දේශපාලනික ව්‍යාපෘති සිදු කිරීමට කාර්යාංශයේ මුදල් වැය කිරීම හේතුවෙන් ජනතාවට දැවැන්ත මූල්‍ය හානි සිදු කළ අවස්ථාද අපගේ විමර්ශනයේදී අනාවරණය විය.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදේශකවරුන් දෙදෙනාගේ සහායත්, භාණ්ඩාගාර නිලධාරීන්ගේ සහ ජාතික විගණන කාර්යාලයෙන් ලැබෙන සහයෝගයත් අගය කොට සලකමි.

**වෛද්‍ය නිශාන්ත සමරවීර**
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

**විධායක සාරාංශය**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිළිබඳව 2025.02.27 සහ 2025.05.23 යන දිනවල පැවති කාරක සභා පරීක්ෂාවේදී, ආයතනයේ පාලන, මූල්‍ය සහ නියාමන කාර්යයන්හි බරපතල අක්‍රමිකතා සහ දුර්වලතා රැසක් අනාවරණය විය.

2023 ජූනි 20 දිනැතිව සාමාන්‍යාධිකාරීවරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයක් මගින් ජාතික විගණන කාර්යාලයේ විමසුම්වලට පිළිතුරු සැපයීමට පූර්ව අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය කර තිබීම මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව යටතේ විගණකාධිපතිවරයාට පැවරී ඇති බලතල සීමා කිරීමක් මෙහිදී හඳුනා ගන්නා ලදී. තවද, 1985 අංක 21 දරන කාර්යාංශ පනතේ ප්‍රතිපාදන අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් 11 දෙනාගෙන් 4 දෙනෙකු බලපත්‍රලාභී විදේශ සේවා නියෝජිතායතන නියෝජනය කිරීමෙන් ළබැඳියාවන්ගේ ගැටුමක් නිර්මාණය වී ඇත. ආයතනික වශයෙන්, 2024.12.31 වන විට කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 156 ක් පැවතුණු අතර, විදේශ දූත මණ්ඩල සේවයට නිලධාරීන් පත් කිරීමේදී ද නව බඳවා ගැනීමේ පටිපාටිය (SOR) උල්ලංඝනය කර ඇති බවත්, කාර්යාංශය විසින් ආරම්භ කළ රැඳවුම් නිවාස 12 න්, අබුඩාබි, කුවේට් යන රටවල්හි ඇති රැඳවුම් නිවාස ඇතුළුව රැඳවුම් නිවාස 07 ක් වසා දමා ඇති බවත්, දැනට 05 ක් පමණක් පවත්වාගෙන යන බවත් අනාවරණය විය.

කාර්යාංශය විසින් 2023 මාර්තු 20 දිනැති අංක 07/2023 සහ මැයි 04 දිනැති අංක 10/2023 චක්‍රලේඛ මගින්, 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 53(3) වගන්තිය නොසලකා, රැකියා ගිවිසුම් නොමැතිව ගෘහ සේවිකාවන් සංචාරක වීසා මත එක්සත් අරාබි එමීර් රාජ්‍යයට හා ඕමානයට පිටත් කර හැරීමට අනුමැතිය ලබා දී ඇත. 2025 මාර්තු 07 දින වන විට මෙම ක්‍රමය යටතේ ගෘහ සේවිකාවන් 6,290 ක් පමණ විදේශගත කර ඇති අතර , විගණකාධිපති විමර්ශනවලට අනුව 1,310 දෙනෙකුට රැකියාවක් ලැබී නොමැති අතර, 818 දෙනෙකුගේ තොරතුරු සම්පූර්ණයෙන්ම අතුරුදහන් වී ඇත. මේ සම්බන්ධයෙන් නිලධාරීන් 06

දෙනෙකුගේ වැඩ තහනම් කර, නියෝජිතායතන 15 ක ක්‍රියාකාරිත්වය අත්හිටුවා ඇත.

2023 ජනවාරි සිට 2024 මැයි 29 දක්වා කාලය තුළ ගෘහ සේවිකාවන් 28,165 දෙනෙකුට නේවාසික පුහුණුව (දින 28) ලබා නොදීම හේතුවෙන් කාර්යාංශයට රුපියල් 631,177,650 ක පුහුණු ආදායමක් අහිමි වී තිබේ. මෙම ක්‍රියාවලිය හරහා බාල වයස්කරුවන් 683 ක් විදේශගත වී ඇති අතර, නිසි පුහුණුව නොලැබූ ශ්‍රමිකයන් සම්බන්ධ පැමිණිලි 1,925 ක් ලැබී ඇත.

'ජයගමු ශ්‍රී ලංකා' රැකියා පොළ වැඩසටහන් සඳහා සමස්ත මූල්‍ය වියදම රුපියල් බිලියන 1.25 ක් වූ අතර, මෙයින් වෙළඳ කුටි සඳහා පමණක් රුපියල් මිලියන 542.8 ක් වැය කර ඇත. 2022 ඔක්තෝම්බර් මස ගාල්ලේ පැවති වැඩසටහන සඳහා කුටියක් රුපියල් 170,000 බැගින් කුලියට ගත්තද, 2023 ජූලි මස යාපනයේ පැවති වැඩසටහනට එම කුටියක මිල රුපියල් 500,000 ක් දක්වා ඉහළ දමමින්, කුටි එකම පුද්ගලික ආයතනයකින් ලබාගෙන තිබීම කාරක සභාවේ අවධානයට ලක් විය. රුපියල් මිලියන 500 ඉක්ම වූ මෙම ප්‍රසම්පාදනය, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුවකට යොමු නොකිරීම බරපතල තත්ත්වයකි. එසේම, මෙම වැඩසටහන් මාලාව හරහා 2024 දෙසැම්බර් 31 වන විට විදේශගත වී ඇත්තේ ශ්‍රමිකයන් 336 ක් පමණි.

1991 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා රුපියල් බිලියන 5.1 ක් පමණ වූ කුවේට් වන්දි අරමුදල වසර ගණනාවක් තිස්සේ අක්‍රීයව පැවති අතර, 1997 සිට 2022 දක්වා කාලය තුළ රුපියල් 4,960,937,306 ක පොළී ආදායමක් උපයා තිබුණි. කෙසේ වෙතත්, 2025.02.27 දින කෝප් කමිටුවේ නිර්දේශ අනුව, රුපියල් බිලියන 5.1 ක මෙම අරමුදල කොටස් දෙකක් යටතේ, රුපියල් බිලියන 3 ක් පුහුණු වැඩසටහන් සඳහා ද, රුපියල් බිලියන 2.1 ක් වයස අවුරුදු 60 සම්පූර්ණ කළ ගෘහ සේවිකාවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් සඳහා ද යෙදවීමට තීරණය කර ඇත.

## දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දොළොස්වැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ දොළොස්වැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 462 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව- 2025.09.04 දිනට)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ (පළමු මාස 11 තුළදී) දී පහත සඳහන් පරිදි කාරක සභා රැස්වීම් පවත්වා ඇත.

| අනු අංකය | කැඳවූ ආයතනය | කාරක සභාව පැවැත් වූ දිනය |
|---|---|---|
| 1. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.18 |
| 2. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.20 |
| 3. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.02.27 |
| 4. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.05 |
| 5. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 2025.03.12 |
| 6. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.27 |
| 7. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්ගලික) සමාගම | 2025.04.02 |
| 8. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.05.08 |
| 9. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්ගලික) සමාගම | 2025.05.09 |

| | | |
|---|---|---|
| 10. | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 2025.05.15 |
| 11. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.05.23 |
| 12. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 2025.06.04 |
| 13. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2025.06.20 |
| 14. | මහපොළ භාරකාර අරමුදල | 2025.07.09 |
| 15. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.07.17 |
| 16. | රාජ්‍ය දැව සංස්ථාව | 2025.07.23 |
| 17. | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 2025.08.20 |
| 18. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2025.09.10 |
| 19. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2025.09.12 |
| 20. | ලංකා විදුලිබල මණ්ඩලය | 2025.09.24 |
| 21. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 2025.10.08 |
| 22. | ලංකා සතොස ලිමිටඩ් | 2025.10.10 |
| 23. | ලංකා විදුලිබල මණ්ඩලයේ පරීක්ෂණයට අදාළව එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම හා එහි පරිපාලිත සමාගම් | 2025.10.24 |
| 24. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.19 |
| 25. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.26 |

ඒ අතරින්, 2025.02.27 හා 2025.05.23 යන දෙදින තුළ පරීක්ෂාවට ලක් කළ විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022 සහ 2023 වර්ෂවලට අදාළ විගණකාධිපති වාර්තා සහ එම සමාගමේ වර්තමාන කාර්ය සාධනය පරීක්ෂාවට ලක් කොට නිකුත් කළ කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

**<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය</u>**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2022, 2023 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

| **ආයතනය** | **<u>විගණන මතය</u>** | |
|---|---|---|
| | **<u>2022</u>** | **<u>2023</u>** |
| ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |

<u>විගණන මත වර්ග</u>

**01** <u>තත්ත්වාගණනය නොකළ මතය</u> **(Unqualified Opinion)**
මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

**02** <u>තත්ත්වාගණනය කළ මතය</u> **(Qualified Opinion)**
වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

**03** <u>මතය ව්‍යාචනය කිරීම</u> **(Disclaimer of Opinion)**
ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම හේතුවෙන් ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

**04** <u>අහිතකර මතය</u> **(Adverse Opinion)**
ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

**<u>ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය</u>**
***(විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය)***
**පරීක්ෂා කරන ලද දින - 2025.02.27 හා 2025.05.23**

**<u>2025.02.27 දින සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>**

**01. <u>විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම</u>**

කාර්යාංශයේ සාමාන්‍යාධිකාරිවරයා විසින් 2023 ජූනි 20 දිනැතිව චක්‍රලේඛයක් නිකුත් කරමින්, ජාතික විගණන කාර්යාලයේ විමසුම් සඳහා පිළිතුරු ලබා දීමේදී සියලුම අතිරේක/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් පූර්ව අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය කර ඇත. එමඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව යටතේ ඇති විගණකාධිපතිවරයාට පැවරී ඇති බලතල සීමා වීමක් හා තොරතුරු වසන් කිරීමට උත්සාහ කිරීමක් සිදුවන බව විගණකාධිපතිවරයා කාරක සභාවේදී ප්‍රකාශ කරන ලදී.

හිටපු සභාපතිවරයාගේ වාචික උපදෙස් මත වඩා නිවැරදි පිළිතුරු සැපයීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කර ඇති බවත්, එම චක්‍රලේඛය හේතුවෙන් විගණන විමසුම සඳහා පිළිතුරු ලබා දීමේදී කිසිදු ප්‍රමාදයක් සිදුවී නොමැති බවත්, 2020 වසරේ සිට කලින් නිකුත් කර ඇති සියලු චක්‍රලේඛ නැවත සමාලෝචනය කිරීමට වර්තමාන සභාපතිවරයා විසින් යෝජනා කර ඇති බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේදී ආයතනයේ සාමාන්‍යාධිකාරිවරයාගේ අනුමැතිය නොමැතිව පිළිතුරු ලබා නොදිය යුතු බවට සඳහන් කර ඇති 2023.06.20 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය අවලංගු කර කාරක සභාවට වාර්තා කරන ලෙසට දෙන ලද නිර්දේශය අනුව එම චක්‍රලේඛය අවලංගු කොට ඇති බව 2025.03.11 දිනැතිව කාරක සභාවට දන්වා ඇත .

## 02. ආයතනය සම්බන්ධ පොදු කරුණු

### 2.1 ආයතනික ව්‍යුහය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ප්‍රධාන කාර්යාලය, පළාත් මධ්‍යස්ථාන 09ක්, දිස්ත්‍රික් මධ්‍යස්ථාන 10ක් සහ පුහුණු මධ්‍යස්ථාන 02කින් සමන්විත වේ. විදේශ දූත මණ්ඩල 15ක කම්කරු සුබසාධන අංශ පිහිටුවා ඇත. විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් විවිධ ගැටළුවලට මුහුණ දෙන විගමණිකයන් තාවකාලිකව රඳවා ගැනීම සඳහා ආරම්භ කර තිබූ රැඳවුම් නිවාස 12න්, අබුඩාබි, ජෝර්දානය, ලෙබනන්, මැලේසියාව, සයිප්‍රස්, බහරේන්, කුවේට් යන රටවල්වල තිබූ රැඳවුම් නිවාස 07ක් වසා දමා ඇත. වර්තමානය වන විට රැඳවුම් නිවාස 05ක් පමණක් පවත්වාගෙන යනු ලබයි. එසේම විගමණික ශ්‍රමිකයන් හුරුකිරීමේ හා පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් පුහුණු මධ්‍යස්ථාන 2ක් පවත්වාගෙන යනු ලබයි.

මෙසේ වසා දමන ලද රැඳවුම් නිවාස තිබූ රටවල් 07ට අදාළව රැඳවුම් නිවාසයන්හි දූත කාර්යමණ්ඩල නිලධාරීන් පහත පරිදි සේවයේ යොදවා තිබුණි.

| | |
|---|---|
| කුවේට් | 14 |
| බහරේන් | 3 |
| අබුඩාබි | 6 |
| ජෝර්දානය | 7 |
| ලෙබනන් | 4 |
| මැලේසියාව | 5 |

මෙම නිලධාරීන් පත් කරනු ලබන්නේ වසර 02ක් වැනි කාලයක් සඳහා බැවින් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මුහුණ දුන් මූල්‍යමය ගැටළු මත බොහෝ නිලධාරීන් නැවත මෙරටට ගෙන්වා ගත් බවත්, ඒ සඳහා නව නිලධාරීන් පත් කිරීමට කටයුතු කරමින් සිටින බවත් කාරක සභාවට අනාවරණය විය.

විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් විවිධ ගැටලුවලට මුහුණ දුන් විගමනිකයන් තාවකාලිකව රඳවා ගැනීම සඳහා පවත්වාගෙන ගිය රැඳවුම් නිවාස 12න් 7ක් වසා දැමීම සම්බන්ධයෙන් නිශ්චිත වාර්තාවක් ආයතනය සතු නොවන බැවින් එම රැඳවුම් නිවාස 7 වසා දැමීමට හේතු වූ කරුණු සහ ඒවා නැවත ආරම්භ කිරීමට අවශ්‍යතාවයක් පවතීද යන කරුණු ඇතුළත් කරමින් සවිස්තරාත්මක වාර්තාවක් සති 02ක් ඇතුළත ලබාදීමට කටයුතු කරන ලෙස කාරක සභාව නිර්දේශ කරන ලද අතර ඒ අනුව අබුඩාබි, බහරේන්, සයිප්‍රස්, ජෝර්දානය, කුවේට්, ලෙබනනය, මැලේසියාව යන රටවල්හි පිහිටි දූත මණ්ඩලවලට අයත් ආරක්ෂිත නිවාස ( Safe Houses) වසා දැමීමට හේතු ඇතුළත් වාර්තාවක් 2025.03.11 දිනැතිව කාරක සභාව වෙත ලබා දී ඇත.

## 2.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 5(1) (ඇ) වගන්තිය ප්‍රකාරව කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය 11 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. පනතෙහි 5 (1) (ඇ) හි ප්‍රතිපාදන ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පත්කරන ලද සාමාජිකයින් 08 දෙනාගෙන් 04 දෙනෙකු බලපත්‍රලත් විදේශ සේවා නියුක්ති නියෝජිතායතනවල නියෝජිතයන් අතුරින් පත් කොට ඇති බව කාරක සභාවට නිරීක්ෂණය විය.

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 5 (1) (ඇ) ප්‍රතිපාදනය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පත්කරන සාමාජිකයන් 8 දෙනාගෙන් 4 දෙනෙකු බලපත්‍රලාභී විදේශ සේවා නියුක්ති නියෝජිතායතනවල නියෝජිතයින් අතුරින් පත් කිරීම මගින් ලබැඳියාවන්ගේ ගැටුමක් නිර්මාණය වන බැවින් ඔවුන් ඇතුළත් නොවන පරිදි පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම ක්‍රියාත්මක කරන ලෙස කාරක සභාව විසින් නිර්දේශ කරන ලද අතර ඒ අනුව විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් 2025.04.09 දින පැවති සාකච්ඡාවට

අදාළ සාකච්ඡා සටහන 2025.04.30 දිනැතිව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි මාර්ගයෙන් කාරක සභාව වෙත යොමු කර ඇත.

එමෙන්ම කාර්යාංශයේ ලියාපදිංචි බලපත්‍රලාභීන්ගේ ලේඛනයක් කාරක සභාවට ලබා දෙන ලෙසට කරන ලද නිර්දේශය අනුව එම ලේඛනය 2025.03.11 දිනැතිව කාරක සභාව වෙත යොමු කර ඇත.

## 2.3 <u>කාර්ය මණ්ඩල තොරතුරු</u>

2024 දෙසැම්බර් 31 දිනට වූ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | **2024/12/31** දිනට සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | ස්ථිර සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 137 | 91 | 46 |
| තෘතීය මට්ටම | 197 | 173 | 24 |
| ද්විතීය මට්ටම | 692 | 639 | 53 |
| ප්‍රාථමික මට්ටම | 251 | 218 | 33 |
| **එකතුව** | **1277** | **1121** | **156** |

කාර්යාංශයේ කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 156ක් කළමනාකරණ සහකාර කාණ්ඩයේ පුරප්පාඩු 40ක්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මට්ටමේ 4ක් සහ කළමණාකරණ මට්ටමේ 24ක් ඇතුළත් බව කාරක සභාව නිරීක්ෂණය කළාය. මෙම කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු 40ක් වැනි සංඛ්‍යාවක් පැවතීමට ප්‍රධාන හේතුව අධිකරණයේ අත්හිටුවීමේ නියෝගයක් හේතුවෙන් බඳවා ගැනීම් ක්‍රියාවලිය නතර කර තිබීම බව සාමාන්‍යාධිකාරිවරයා සඳහන් කරන ලදී.

ආයතනයේ තනතුරු සඳහා පුරප්පාඩු ඇතිවීමට බලපාන ලද තවත් හේතුවක් වන්නේ කණිෂ්ඨ කළමණාකරුවෙකු, කළමණාකරණ මට්ටමට උසස් වීමක් ලැබීමට වසර 10ක් වැනි දීර්ඝ කාලයක් ගතවීම බව කාරක සභාවට අනාවරණය විය.

එසේම, 2018 වර්ෂයේදී උසස්වීම් ලබාදීම සඳහා දුක්ගැනවිලි කමිටුවක් පත් කළ බවත්, එම කමිටුවේ තීරණයන්ට එරෙහිව සේවක පිරිසක් මූලික අයිතිවාසිකම් නඩු 2ක් ආයතනයට විරුද්ධව ගොනු කළ බවත්, ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සහකාර කළමනාකාර උසස්වීම් සම්බන්ධයෙන් අතිහිටුවීමේ නියෝගයක් ලබා දී එය වසර 5ක පමණ කාලයක් පැවති බවත්, අධ්‍යාපන සුදුසුකම් සපුරාගැනීමේ ඇතිවූ ගැටළුවක් මත 2023 වර්ෂයේදී එම නඩු දෙක ඉවත් කර ගෙන ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

සති 3ක් ඇතුළත නව බඳවා ගැනීමේ පටිපාටිය (SOR) සකස් කොට අනුමත කර ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් නිර්දේශ කරන ලද අතර ඒ අනුව බඳවා ගැනීමේ පටිපාටියේ (SOR) අවසාන කෙටුම්පත, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතියට යොමු කරමින් 2025.04.24 දිනැතිව රේඛීය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් යැවූ ලිපිය 2025.05.22 දිනැතිව කාරක සභාව වෙත ඉදිරිපත් කොට ඇත.

2018 දුක්ගැනවිලි කමිටුව මඟින් අසාධාරණයට ලක්වූ බව පවසන සහකාර කළමණාකාර ධූරයේ සේවකයන්ගේ ගැටළුව නැවත සොයා බලා විසඳුමක් ලබා දෙන ලෙස කාරක සභාව විසින් නිර්දේශ කරන ලද අතර ඒ අනුව අදාළව උසස්වීම් සම්බන්ධයෙන් වන සේවක දුක්ගැනවිලි හා බඳවා ගැනීමේ පටිපාටිය සම්බන්ධයෙන් විමසා බැලීමට කමිටුවක් පත් කරන ලෙස ඉල්ලමින් 2025.04.02 සහ 2025.05.02 දිනැතිව විෂය භාර අමාත්‍යවරයා වෙත ලිපි යොමුකර ඇති බවත් ඒ පිළිබඳව තවදුරටත් පැහැදිලි කර දෙන ලෙස 2025.05.14 දිනැතිව

රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීමක් කර ඇති බවත්, 2025.05.22 දිනැතිව කාරක සභාව වෙත දන්වා ඇත.

<u>**කාරක සභාවේ නිර්දේශය**</u>

**දැනටමත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති බඳවා ගැනීමේ පටිපාටිය හැකි ඉක්මනින් අනුමත කොට ක්‍රියාත්මක කළ හැකි මට්ටමට සම්පූර්ණ කිරීම.**

### 03. <u>කාර්යාංශය විසින් රැකියා සඳහා ගෘහ සේවිකාවන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට හා ඕමාන් රාජ්‍යයට සංචාරක වීසා මත රැකියා ගිවිසුමක් නොමැතිව විදේශගත කිරීම</u>

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 53(3) වගන්තිය අනුව ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා බැහැර යන සෑම ශ්‍රී ලාංකිකයෙකුම කාර්යාංශයේ ලියාපදිංචි විය යුතුය. එසේවුවද, 2023 මාර්තු 20 දිනැති 07/2023 සභාපති චක්‍රලේඛය මගින් ඇමෙරිකානු ඩොලර් 100ක් තැන්පත් කර, එක්සත් අරාබි එමීර් රාජ්‍යයට හා ඕමානයට රැකියා ගිවිසුමක් නොමැතිව ගෘහ සේවිකාවන් ලෙස සංචාරක වීසා මත විදේශගත කිරීමට අනුමැතිය ලැබී තිබේ. එම චක්‍රලේඛය ප්‍රකාරව විදේශ රැකියා නියෝජිතායතනය දින 30ක් ඉක්මයාමට පෙර රැකියාවක් ලබාදිය යුතු අතර, දින 45ක් යන තෙක් රැකියාවක් නොලැබුණේ නම් අදාළ නියෝජිත විසින් ගෘහ සේවිකාවන් නැවත ලංකාවට ගෙන්විය යුතුය.

කොවිඩ් වසංගතය හා ඉන් පසුව ඇතිවූ ආර්ථික අර්බුදය හමුවේ විදේශ රැකියා නියෝජිතායතනවල ඉල්ලීම මත, සංචාරක වීසා මගින් ශ්‍රමිකයන් (විශේෂයෙන් ගෘහ සේවිකාවන්) එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි රටවලට යැවීමේ ක්‍රමවේදයක් විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් හඳුන්වා දී ඇත. එරට පවතින 'තද්බීර්' (Tadbeer) යාන්ත්‍රණයට අනුගත වෙමින්, රැකියා වීසා ලබා දීමට වඩා අඩු පිරිවැයකින් ශ්‍රමිකයන්

බඳවා ගැනීමට එම රටවල සේවායෝජකයන් දක්වන කැමැත්ත මෙයට හේතු වී තිබේ. සංචාරක වීසා මඟින් යවනු ලබන ශ්‍රමිකයන්ට දින 45ක් ඇතුළත රැකියාවක් සොයා දීමට අසමත් වුවහොත් අදාළ නියෝජිතායතනය අසාධු ලේඛන ගත කරන බවත්, සමථ අංශය මඟින් අදාළ ශ්‍රමිකයා ආපසු ලංකාවට ගෙන්වා ගැනීමට කටයුතු කරන බවත් කාරක සභාවට අනාවරණය විය.

කෙසේ වුවද, 2023 මාර්තු 20 සිට 2024 ජූනි 6 දක්වා, ඉහත සඳහන් රාජ්‍යයන් දෙක වෙත සංචාරක වීසා මත ගෘහ සේවිකාවන් 4,942ක් පිටත් කර ඇති අතර ඉන් 3,954ක් වෙත රැකියාවක් ලබාදුන් බවට අදාළ ලියකියවිලි තානාපති කාර්යාලයේ තොරතුරු පරිගණක පද්ධතියට උඩුගත කර නොතිබුණි. තවද, 2024 ජූනි 06 වන විට විදේශගත වු එම ගෘහ සේවිකාවන්ගෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පැමිණිලි 225ක් සහ ඕමාන රාජ්‍යයේ පැමිණිලි 17ක් ලැබී තිබුණු අතර, 2023 දෙසැම්බර් 21 වන විට 11 දෙනෙකු ඩුබායි සුරක්ෂා නිවාසයේ නවාතැන් ගෙන සිටි බව නිරීක්ෂණය විය.

2025 පෙබරවාරි 25 වන දින වන විට ශ්‍රමිකයන් 6290ක පිරිසක් සංචාරක වීසා ක්‍රමය යටතේ විදෙස්ගත වුවත් උඩුගත කර ඇත්තේ 4300 කගේ රැකියා දත්ත පමණක් බවත්, ඒ අතරින් 742ක පිරිසක් අතුරුදන්ව ඇති බවත්, දින 45ක් ඇතුළත 365ක පිරිසක්ද, දින 45ට වැඩි 880ක පිරිසක්ද රැකියා නොමැතිව සිටින බවත් කාරක සභාවට අනාවරණය විය.

මේ අනුව, ආයතනයට ඇති වගකීම මුළුමනින්ම පැහැර හැර මිනිස් ජාවාරමක් වැනි ක්‍රියාවක නියුතු වූ ස්වභාවයක් මේ සම්බන්ධයෙන් දක්නට ලැබෙන බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

කාර්යාංශයේ නියාමන කාර්යභාරය පිළිඹිබු වන පරිදි 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 5 (1) (ඇ) , 14.1 හා 14.3 යන වගන්ති සංශෝධනය කිරීමට යෝජනා කරමින් කාරක සභාව විසින් නිර්දේශයක් ලබා දුන් අතර ඒ අනුව විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක නියෝජ්‍ය අමාත්‍යවරයාගේ

ප්‍රධානත්වයෙන් 2025.04.09 දින පැවති සාකච්ඡාවට අදාළ සාකච්ඡා සටහන 2025.04.30 දිනැතිව කාරක සභාව වෙත යොමු කර ඇත.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයට හා ඕමාන් රාජ්‍යයට රැකියා ගිවිසුමක් නොමැතිව සංචාරක වීසා මත ගෘහ සේවිකාවන් විදේශගත කිරීම සම්බන්ධ වැඩසටහනෙහි ඇති දුර්වලතා සහ එමඟින් විදේශගත වූ පිරිසට සිදු වූ සමස්ථ හානිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආයතන සංග්‍රහයට අනුකූලව සිදු කර වාර්තාවක් සකස් කර කාරක සභාවට ඉදිරිපත් කිරීම හා ඒ අනුව අදාළ පුද්ගලයන්ට නිශ්චිත දඬුවම් ලබා දෙන ලෙස කාරක සභාව නිර්දේශ කරන ලද අතර ඒ අනුව විමර්ශන නිලධාරියෙකු පත් කරන ලෙස ඉල්ලා සිටිමින් රේඛීය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් 2025.06.09 දිනැතිව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවන ලද ලිපියේ පිටපතක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ගෘහ සේවිකාවන් ලෙස කාන්තාවන් විදේශගත කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කොට ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් නිර්දේශ කරන ලද අතර ඒ අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කර අමාත්‍යවරයාගේ අවධානයට යොමු කිරීමට කටයුතු සිදු කෙරෙමින් තිබෙන බව 2025.05.22 දිනැතිව කාරක සභාව වෙත දන්වා ඇත.

2023 මාර්තු 20 දිනැති අංක 07/2023 දරන සභාපති චක්‍රලේඛය කාර්යාංශ පනතේ 53(3) වගන්තිය උල්ලංඝනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද නොමැතිව නිකුත් කර ඇති බැවින් ඒ හා සම්බන්ධ සියලුම චක්‍රලේඛ අවලංගු කරන ලෙස කාරක සභාව විසින් නිර්දේශ කරන ලද අතර ඒ අනුව කටයුතු කළ බව 2025.04.30 දිනැතිව කාරක සභාව වෙත දන්වා ඇත.

මෙම චක්‍රලේඛය යටතේ විදේශගත වූ ගෘහ සේවිකාවන්ගෙන් ලැබී ඇති එක්සත් අරාබි එමීර් රාජ්‍යයට අදාළව ලද පැමිණිලි 225 හා ඕමාන් රාජ්‍යයට අදාළව ලද පැමිණිලි 17ට අදාළව ඔවුන් විදේශගත කළ

නියෝජිත ආයතන සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර කාරක සභාවට දැනුම් දෙන ලෙස කාරක සභාව නිර්දේශ කරන ලද අතර ඊට අදාළව ගන්නා ලද පියවර 2025.04.30 දිනැතිව, කාරක සභාව වෙත දන්වා ඇති අතර ඒ අනුව අදාළ නියෝජිතායතනවලට එරෙහි පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති බව දන්වා ඇත.

තානාපති කාර්යාලයේ තොරතුරු පරිගණක පද්ධතියට උඩුගත නොකරන ලද ගෘහ සේවිකාවන් 880දෙනා සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් නිර්දේශ කරන ලද අතර ඒ අනුව අදාළ වාර්තාව 2025.04.30 දිනැතිව, කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ඊට අදාළ සේවා ගිවිසුම් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් නිර්දේශ කරන ලද අතර ඒ අනුව අදාළ සේවා ගිවිසුම් 2025.04.01 දිනැතිව කාරක සභාව වෙත ලබා දී ඇත.

**04. <u>නේවාසික පුහුණුවක් ලබා නොදී ගෘහ සේවිකාවන් විදේශගත කිරීමේ ක්‍රමවේදය හේතුවෙන් කාර්යාංශයට අලාභයක් සිදුවීම</u>**

ප්‍රථම වරට විදේශගත වන ගෘහ සේවිකාවන්ට තෑගි වවුචර් බෙදා දීමේ වැඩසටහනක් සඳහා 2023 ඔක්තෝබර් 13 වන දින කාර්යාංශය විසින් රුපියල් කෝටි 13.86ක මුදලක් වැය කර තිබිණි. ඒ සඳහා රු. 10,000 බැගින් වූ වවුචර් 14,000ක් සහ රු. 2,500 බැගින් වූ වවුචර් 28,000ක් මිලදී ගෙන තිබුණු අතර 2024 අගෝස්තු 14 වන විට රු. 128,229,300ක වටිනාකමක් සහිත වවුචර් 13,005ක් භාවිතා නොකර ඉතිරි වී තිබිණි. ප්‍රථම වතාවට විදේශගත වන කාන්තාවන් පෙර විදේශ ගතව සිටි බවට ලියකියවිලි ඉදිරිපත් කර පුහුණුවෙන් නිදහස් කර තිබීම හා උත්සවය පැවැත්වීම ප්‍රමාදවීම මේ සඳහා හේතු වී තිබිණි.

පළමු වතාවට විදේශ ගතවන ගෘහ සේවිකාවන් සඳහා 2022 ජූනි 07 දිනැති කාර්යාංශයේ සභාපතිගේ ලිපියට හා 2023 ජනවාරි 09 දිනැති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු) ලිපියට පටහැනිව රු.22,410 ක ගාස්තුවක් අය

කර දින 28 ක (NVQ Level 3) නේවාසික පුහුණුවක් ලබා නොදී 2023 ජනවාරි සිට 2024 මැයි 29 දින දක්වා කාල පරිච්ඡේදය තුළදී ගෘහ සේවිකාවන් 28,165 දෙනෙක් පළමු වතාවට විදේශගත කර තිබීම හේතුවෙන් රු.631,177,650ක පුහුණු ආදායමක් කාර්යාංශයට අහිමි වී තිබුණි.

2022 වර්ෂයේ ජූනි මාසයේ සිට අවම වශයෙන් දින 150ක කාලයක් විදේශ ගතව සිටි ශ්‍රමිකයන් සඳහා පුහුණුවකින් තොරව මාර්ගගත ක්‍රමයක් ඔස්සේ අනුමැතිය ලබා ගෙන, නැවත විදේශගත වීමට අවසර ලබා දීමට හිටපු විදේශ රැකියා හා කම්කරු අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි කාර්යාංශයේ හිටපු සභාපතිවරයා විසින් කටයුතු කර ඇති බව කාරක සභාවට අනාවරණය විය.

කෙසේ වුවත් මෙම අනියම් ක්‍රමවේදය හේතුවෙන්, පළමුවරට විදේශගත වන එහෙත් කාර්යාංශය නොමඟ යවමින් කලින් පළපුරුද්ද ඇති බව හඟවන ගෘහ සේවිකාවන් නිසි පුහුණුව නොලැබ විදේශ ගතවීම හේතුවෙන් ඔවුන්ට ගැටළු ඇතිවූ අතර කාර්යාංශයට ලැබිය යුතු පුහුණු ආදායම අහිමි විය.

එමෙන්ම මෙම ක්‍රියාවලිය හරහා හරහා බාල වයස්කාරයින් 683ක් විදේශගත වී ඇති බවත්, නිසි පුහුණුව නොලැබූ ශ්‍රමිකයන් සම්බන්ධ පැමිණිලි 1,925ක් ලැබී ඇති බවත්, විදෙස්ගත වන කාන්තාවන්ගේ පවුල් හා දරුවන් සම්බන්ධ සමාජ ප්‍රශ්න රැසක් ඇති වී තිබෙන බවත්, මේ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරිවරයා සිය වගකීම් පැහැර හැරීමක් සිදු කර ඇති බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

උක්ත ක්‍රියාවලිය සිදුකිරීම සම්බන්ධයෙන් වූ සාමාන්‍යාධිකාරීවරයාගේ ක්‍රියාකලාපයට අදාළව පරීක්ෂණයක් පවත්වා ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාවට ලබා දෙන ලෙස නිර්දේශ කරන ලද අතර ඒ අනුව එම වාර්තාව 2025.05.20 දිනැතිව කාරක සභාව වෙත ලබා දී ඇත. එමෙන්ම නේවාසික පුහුණුවක් ලබා නොදී ගෘහ සේවිකාවන් විදේශගත කිරීම සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරීවරයා විසින් නිකුත් කළ චක්‍රලේඛය කාරක

සභාවට ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලද අතර ඒ අනුව එම චක්‍රලේඛය 2025.03.11 දිනැතිව කාරක සභාව වෙත ලබා දී ඇත.

**05.** <u>**රැකියා පොළ වැඩසටහන් සඳහා වෙළඳ කුටි කුලියට ගැනීමේ දී නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම**</u>

කාර්යාංශය විසින් පැවැත්වූ රැකියා වෙළඳපොළ වැඩසටහන්වල වෙළඳ කුටි මිලදී ගැනීමේදී බරපතල මූල්‍ය අක්‍රමිකතා සහ විනිවිදභාවය පිළිබඳ ගැටළු පවතින බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

2022 ඔක්තෝබර් 15 සහ 16 දින ගාල්ලේ පැවති වැඩසටහනට කුටි 30ක් රුපියල් 170,000 බැගින් කුලියට ගෙන ඇති බවත්, 2023 ජූලි 15 සහ 16 දින යාපනයේ වැඩසටහන සඳහා එම කුටියක මිල රු. 300,000කින් වැඩි කරමින්, කුටි 25ක් රුපියල් 500,000 බැගින් එකම පුද්ගලික ආයතනයකින් කුලියට ගෙන ඇති බවත්, 2023 මැයි 29 දින කම්කරු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියක් මත පදනම්ව, කුටි 25 සඳහා රුපියල් මිලියන 12.5ක ගෙවීමක් ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ සිදු කර ඇති බවත්, 2024 වසරේදී "ජයගමු ශ්‍රී ලංකා" වැඩසටහන් යටතේ දිස්ත්‍රික්ක 24ක පැවති රැකියා පොළවල් සඳහා රුපියල් මිලියන 542.8ක් වැය වූ බවත්, සමස්ත වැඩසටහන සඳහා රුපියල් බිලියන 1.25ක මූල්‍ය වියදමක් දරන ලද බවත්, එසේ වූවද, 2024 දෙසැම්බර් 31 වන විට මෙම වැඩසටහන් මාලාව හරහා විදේශගත වූ ශ්‍රමිකයන් සංඛ්‍යාව 336ක් පමණක් බවත් කාරක සභාවට අනාවරණය විය.

රුපියල් මිලියන 500 ඉක්මවූ මෙම අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදන අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවකට යොමු නොකිරීම බරපතල තත්ත්වයක් බැවින්, විගණකාධිපතිවරයා විසින් පූර්ණ පරීක්ෂණයක් සිදු කරන බව දැනුම් දී ඇත.

මෙම වැඩසටහන් සඳහා අවශ්‍ය වෙළෙඳ කුටි නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව එකම පුද්ගල ආයතනයකින් කුලියට ලබා ගැනීම සඳහා රු. 12,500,000ක් ගෙවීම් කිරීමට අදාළව අමාත්‍යාංශය

විසින් පරීක්ෂණයක් පවත්වන ලෙස කාරක සභාව විසින් නිර්දේශ කරන ලද අතර ඒ අනුව අදාළ පරීක්ෂණය විගණකාධිපතිවරයා මාර්ගයෙන් සිදු කර ගැනීමට අමාත්‍යාංශය විසින් 2025.04.01 දිනැතිව කාරක සභාවෙන් විමසන ලදුව, ඒ සඳහා කාරක සභාවේ සභාපතිවරයාගේ එකඟතාවය 2025.04.28 දිනැතිව අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දී තිබේ.

සමස්ථ වැඩසටහන සඳහා කාර්යාංශ ප්‍රසම්පාදන කමිටු මගින් සිදු කරන ලද ප්‍රසම්පාදනයන්ට අදාළ සියළු ලිපි ලේඛන කාරක සභාවට ඉදිරිපත් කරන ලද නිර්දේශයට අනුව එම ලිපිලේඛන 2025.04.01 දිනැතිව කාරක සභාව වෙත ලබා දී ඇත.

**06. <u>ඕමාන් තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේ 2022 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා වූ ගෙවීම් වවුචර්පත් මුදල් රෙගුලාසි 273 ප්‍රකාරව මේ දක්වා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම</u>**

විගණන විමසුමට පිළිතුරු ලෙස, වවුචර් මෙරටට එවීමේදී විශාල වියදම් ඇතිවන බැවින් ඉදිරියේදී මෙම ක්‍රියාවලිය ඩිජිටල් කිරීමට බලාපොරොත්තු වන බව කාර්යාංශයේ වැඩබලන සභාපතිගේ අත්සනින් යුතු ලිපියකින් දන්වා ඇති බවත් වවුචර්පත් ලබා නොදීමේ අරමුණක් එතුළින් ගම්‍ය වන බවට වන විගණකාධිපතිවරයාගේ අදහස කෙරෙහි කාරක සභාවේ අවධානය යොමු විය.

කෙසේ වෙතත්, ඕමාන තානාපති කාර්යාලයේ උපදේශක ලෙස සේවය කළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති) විසින් සියලුම වවුචර්පත් ලංකාවට එවා ඇති අතර, ඒවා ලැබීමෙන් පසු වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) විසින් ජාතික විගණන කාර්යාලයට භාර දී ඇත. ඉන්පසු වවුචර්පත් ඉදිරි කටයුතු සඳහා බදුල්ලේ පිහිටි උපකාර්යාලයකට යොමු කිරීමට චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

ප්‍රධාන කාර්යාලයේ ඉඩකඩ සහ කාර්ය මණ්ඩල හිඟයක් පැවතීමත්, බදුල්ලේ උප කාර්යාලයේ ප්‍රමාණවත් ඉඩකඩ පැවතීම සහ බොහෝ කාර්ය මණ්ඩලය බදුල්ල ප්‍රදේශවාසීන් වීමත් හේතුවෙන් 'Back Office' සංකල්පය යටතේ වවුචර්පත් තැන්පත් කිරීම සහ වෙනත් විශේෂ

කාර්යයන් එම කාර්යාලයේ සිදු කෙරේ. මෙහෙයුම් අධීක්ෂණය සඳහා ගිණුම් නිලධාරියෙකු ප්‍රධාන කාර්යාලයෙන් සහ කළමනාකරුවෙකු උපකාර්යාලයෙන් යොදවා ඇති අතර, දූත මණ්ඩල ගිණුම් කටයුතු සඳහා නිලධාරීන් හතර දෙනෙකු යොදවා ඇත.

අදාළ වවුචර්පත් මෙරටට ගෙන්වා ගැනීමට නිශ්චිත වැඩපිළිවෙළක් සකස් කරන ලෙස කාරක සභාව නිර්දේශ කරන ලද අතර ඒ අනුව නිසි වැඩපිළිවෙලක් සකස් කර ඇති බව 2025.05.22 දිනැතිව කාරක සභාව වෙත දන්වා ඇත.

කාර්යාංශය යටතේ බදුල්ල ප්‍රදේශයේ පිහිටි ප්‍රාදේශීය කාර්යාලය පිහිටුවීමේ පසුබිම, කාර්යාංශයේ කාර්ය භාරය, අනුයුක්ත කර ඇති සේවක සංඛ්‍යාව හා තවදුරටත් කාර්යාලය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් පූර්ණ අධ්‍යයනයකින් අනතුරුව සකස් කර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලද අතර ඒ අනුව අදාළ වාර්තාව 2025.04.30 දිනැතිව කාරක සභාව වෙත ඉදිරිපත් කොට ඇත.

## 07. <u>කුවේට් වන්දි අරමුදල් ගිණුම</u>

1991 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින වන විටත් පවතින රු. බිලියන 5.1ක් පමණ වන කුවේට් වන්දි අරමුදල සම්බන්ධයෙන් කළමනාකාරිත්වය කිසිදු තීරණයක් ගෙන නොතිබීම කාරක සභාවේ අවධානයට යොමු විය.

වන්දි ඉල්ලුම්කරුවන් 948 දෙනෙකුගේ ලේඛනයක් තිබුණද, අවශ්‍ය ලිපි ලේඛන නොමැති වීම හේතුවෙන් ගෙවීම් සිදු කිරීමට නොහැකිවී ඇති බවත්, 1997 වසරේ සිට 2022 වසර දක්වා නොගෙවන ලද මුදල් ආයෝජනය කර රු. 4,960,937,306 ක පොළී ආදායමක් උපයා ඇති බවත්, 2023 මාර්තු සහ අප්‍රේල් මාසවලදී විශ්‍රාම වැටුප් ක්‍රමයකට සහ ණය යෝජනා ක්‍රමයකට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණද, අරමුදල මෙතෙක් භාවිතා කර නොතිබුණු බවත්, 2007 නොවැම්බර් 19 දින අයදුම් කළ විගමනික ශ්‍රමිකයෙකුගේ සියලු ලියකියවිලි අනුමත වී වසර 15ක් ගතවී

ඇතත්, ඔහුට වන්දි ගෙවීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී

වසර 35ක් ගතවී ඇති කුවේට් වන්දි මුදල් ඉල්ලීමට, නාම ලේඛනයේ සිටින ශ්‍රමිකයින් 948 දෙනාගෙන් කිසිවකු ඉදිරිපත් නොවී ඇති බැවින්, කාර්යාංශයට ඔවුන්ගේ සේවය තහවුරු කිරීමට හැකියාවක් නොමැති බවත්, අරමුදල භාවිතයෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් සඳහා 2023.04.24 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත්, බහුවිධ ණය යෝජනා ක්‍රමයකට අනුමැතිය නොලැබුණද, කාර්යාංශයේ සුබසාධක අරමුදල් භාවිතයෙන් එවැනි ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කර, මේ වන විට පුද්ගලයින් 138 දෙනෙකුට රුපියල් මිලියන 260ක මුදලක් ලබා දී ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

අක්‍රීයව ඇති මෙම අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට පවතින රු. බිලියන 5.1 ක ශේෂය යොදා ගනිමින් ශ්‍රමිකයින් විදේශීය රැකියාවන්ට යැවීමේදී අවශ්‍ය අදාළ පුහුණු වැඩසටහන් ලබා දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බලා වාර්තාවක් ලබා දීමට කාරක සභාව විසින් නිර්දේශ කරන ලද අතර ඒ අනුව සකස් කරන ලද යෝජනාවලිය තවදුරටත් අධ්‍යයනය කොට, එය ආයතනයේ සංයුක්ත සැලැස්මට හා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලෙසට නිර්දේශ කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් තීරණය (Board Decision), 2025.05.22 දිනැතිව කාරක සභාවට ඉදිරිපත් කොට ඇත.

## 08. <u>විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරීන් පත් කිරීම</u>

විදේශ දූත මණ්ඩලවල පිහිටි කම්කරු සුභසාධන අංශ සඳහා කාර්යාංශ නිලධාරීන් තෝරා ගැනීමේ තත්ත්වයන් පිළිබඳව කාරක සභාව අවධානය යොමු කරන ලදී.

2023 අප්‍රේල් මස 06 දිනැති සභාපති චක්‍රලේඛය අංක 01/2023 ප්‍රකාරව, ඉහතදී දූත මණ්ඩල සේවයේ නොයෙදුනු අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් ලබා දිය යුතු බවත්, එසේම විදේශ සේවය අවසන් කළ

නිලධාරීන් යළි අයදුම් කිරීමට ප්‍රථම කාර්යාංශයේ වසර 3ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු බවත්, ඉන් ඉහතදී විදේශ දූත මණ්ඩල සේවයේ නිරතව සිටි කාර්යාංශ නිලධාරීන් 07 දෙනෙකු නැවත වරක් 2023 වර්ෂයේදී විදේශ දූත මණ්ඩල සේවය සඳහා තෝරා ගෙන තිබුණු බවත්, ඉන් දෙදෙනෙකු තුන් වන හා හතර වන වතාවට සේවය අවසන් කර පැමිණි නිලධාරීන් වූ බවත්, විදේශ දූත මණ්ඩල සේවය අවසන් කර වසර 3ක් සම්පූර්ණ නොකළ නිලධාරියෙකු ද බඳවාගෙන තිබුණු බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

මේ වන විට රටවල් 13ක කම්කරු සුභසාධන අංශ 15ක් පවතින බවත්, 2023 ජනවාරි 07 දිනැතිව නව බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත වී තිබුණද, ඊට පටහැනිව හිටපු සභාපතිගේ චක්‍රලේඛයකට අනුව බඳවා ගැනීම් සිදුවී ඇති බවත්, ඇතැම් අවස්ථාවල නව පටිපාටිය අනුගමනය නොකර, බාහිරින් පුද්ගලයන් බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනතේ 14(1) වගන්තිය යටතේ හිටපු අමාත්‍යවරයාගේ නිර්දේශයක් ද ලබාගෙන ඇති බවට පැහැදිලි විසංවාදයක් පවතින බවත් කාරක සභාවට අනාවරණය විය. දේශපාලන බලපෑම් හේතුවෙන් අභ්‍යන්තරයෙන් බඳවා ගැනීම් සම්බන්ධයෙන් පැමිණිලි ලැබී ඇති බවත්, හිටපු අමාත්‍යවරයා විසින් බාහිරින් පත් කරන ලද නිලධාරීන්ගේ කාර්ය සාධනය පිළිබඳව ද ගැටලු පවතින බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරීන් පත් කිරීමේදී 2023 අප්‍රේල් 06 දින අංක 01/2023 දරන සභාපති චක්‍රලේඛයේ විධිවිධාන උල්ලංඝණය කරමින් කර ඇති පත් කිරීම් පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කර ඒ මඟින් විධිමත් පරීක්ෂණයක් පවත්වා බඳවා ගැනීම් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමට කාරක සභාව විසින් නිර්දේශය කරන ලද අතර ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙන ලෙස කාර්යාංශය විසින් 2025.03.20 දිනැතිව රේඛීය අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටි බවත්, විෂය භාර අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කොට කඩිනමින් මේ සඳහා පියවරක් ගන්නා බවත් 2025.05.22 දිනැතිව කාර්යාංශය විසින් කාරක සභාව වෙත දන්වා ඇත.

## 2025.05.23 දින සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

### 01. කාර්යාංශය විසින් රැකියා සඳහා ගෘහ සේවිකාවන් එක්සත් අරාබි එමිර් රාජ්‍යයට හා ඕමාන් රාජ්‍යයට සංචාරක වීසා මත රැකියා ගිවිසුමක් නොමැතිව විදේශගත කිරීම

කාර්යාංශය විසින් නිසි තෝරාගැනීමේ ක්‍රමවේද අනුගමනය නොකර හදිසි බඳවා ගැනීම් හරහා සුදුසුකම් නොමැති කාන්තාවන් විදේශගත කිරීම මඟින් සමස්ථ නියාමන ක්‍රියාවලියම උල්ලංඝනය කර ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය. විශේෂයෙන්ම දින 45ක කාලසීමාවක් සඳහා සංචාරක වීසා මත විදේශගත වන ශ්‍රමිකයන් පිළිබඳව හෝ ඔවුන්ට රැකියා ලැබුණේද යන්න පිළිබඳව කාර්යාංශය නිසි පසු විපරමක් හෝ නියාමනයක් සිදු කර නොමැති වීම පිළිබඳව කාරක සභාව සිය අප්‍රසාදය පළ කළාය.

විගණකාධිපතිවරයාගේ කරුණු දැක්වීමට අනුව 2023 වසරේ නිකුත් කළ සභාපති චක්‍රලේඛ අංක 07/2023 සහ 10/2023 මඟින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට සහ ඕමාන් රාජ්‍යයට සංචාරක වීසා මඟින් ගෘහ සේවිකාවන් යැවීමට අවසර දී තිබේ. එහිදී නියෝජිතායතන විසින් එක් ශ්‍රමිකයෙක් වෙනුවෙන් ඇමරිකානු ඩොලර් 100ක පරිපාලන ගාස්තුවක් තැන්පත් කළ යුතු වුවද එය නිසි පරිදි ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. 2025.03.07 දින වන විට ලබා දී ඇති දත්ත අනුව මෙම ක්‍රමය යටතේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයට 5,672ක් සහ ඕමාන් රාජ්‍යයට 629ක් විදේශගත කර ඇති අතර, ඉන් 1,310කට රැකියා ලැබී නොමැත.

තවද, දින 45 ඉක්මවා ගියද දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් නොකළ ශ්‍රමිකයන් 318ක් සිටින බවත්, ඇතැම් පිරිස් වසර 2ක් ගත වන තුරුත් තොරතුරු යාවත්කාලීන කර නොමැති බවත් අනාවරණය විය. කිසිදු තොරතුරක් නොමැති ශ්‍රමිකයන් සංඛ්‍යාව 818කි. කෙසේ වුවද, 2025.05.21 දින වන විට මෙම සංඛ්‍යාව 225 දක්වා අඩු කිරීමට පියවර ගෙන ඇති බවත්, දත්ත ලබා දීමට අපොහොසත් වූ නියෝජිතායතන 103ක කටයුතු තාවකාලිකව තහනම් කර ඇති බවත් නිරීක්ෂණය විය.

2024 ජූනි දක්වා වූ වසර කිහිපය තුළ රැකියා සඳහා ශ්‍රමිකයන් විදේශගත කිරීමේදී බරපතල නීති උල්ලංඝනය කිරීම් සිදු වී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් හිටපු සභාපතිවරයෙකුට එරෙහිව විගණන පරීක්ෂණයක් සහ නිලධාරීන් 6 දෙනෙකුගේ වැඩ තහනම් කරමින් විනය පරීක්ෂණ පවත්වන බවත් නිරීක්ෂණය විය. මින් ඉදිරියට දින 150ක විදෙස් අත්දැකීම් නොමැති සෑම ශ්‍රමිකයෙකුම පුහුණුවකින් පසුව පමණක් විදේශගත කිරීමට කාර්යාංශයේ එකඟතාව පළ විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. රැකියා සඳහා විදේශගත වීමට අපේක්ෂා කරන ශ්‍රමිකයන් දැනුවත් කිරීම සම්බන්ධයෙන් වන කාර්යාංශයේ නියාමන කාර්යභාරය, අභ්‍යන්තර චක්‍රලේඛයක් මඟින් ශ්‍රමිකයන්ට සන්නිවේදනය කිරීම වෙනුවට, අදාළ නියමයන්, රේඛීය අමාත්‍යාංශය මඟින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව ගැසට් පත්‍රයේ පළ කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කිරීම .**

**II. ගෘහ සේවිකාවන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට හා ඕමාන් රාජ්‍යයට සංචාරක වීසා මත රැකියා ගිවිසුමක් නොමැතිව විදේශගත කිරීමේ ක්‍රියාවලියට නිශ්චිතවම වගකිවයුතු නිලධාරියා/ නිලධාරීන් සම්බන්ධයෙන් කාරක සභාව දැනුවත් කිරීම.**

**III. තොරතුරු උඩුගත කර නොමැති ශ්‍රමිකයන් 818 විදේශගත කළ ආයතන සහ එම ආයතනවලට එරෙහිව කාර්යාංශය මඟින් ගත් ක්‍රියාමාර්ග ඇතුළත්ව සම්පූර්ණ වාර්තාවක් විගණකාධිපතිවරයාටද පිටපතක් සහිතව කාරක සභාවට ලබා දීම.**

**IV. දින 45ක් ඇතුළත ශ්‍රමිකයන්ගේ තොරතුරු කාර්යාංශයට ලබාදීමට අපොහොසත් වන නියෝජිතායතන තාවකාලිකව තහනම් කරන බවට වන නියාමන කාර්යය පිළිබඳව විදේශගත වීමට ප්‍රථම, ශ්‍රමිකයන්ට කාර්යාංශය මඟින් ලබා දෙන පුහුණුවට ඇතුළත් කර ඒ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කිරීම.**

**V.** **විගමනික ශ්‍රමිකයන්ගේ තොරතුරු දින 45ක් ඇතුළත කාර්යාංශයට ලබාදීමට අපොහොසත් වන නියෝජිතායතන තාවකාලිකව තහනම් කිරීම හේතුවෙන්, එලෙස තහනම් කරන ලද ආයතනය මඟින් විදේශගත කර ඇති ශ්‍රමිකයන් සහ විදේශගත වීමේ බලාපොරොත්තුවෙන් අදාළ නියෝජිතායතනය සමඟ මුදල් හා වෙනත් ගණුදෙනු කරනු ලබන ශ්‍රමිකයන්ට මුහුණ පෑමට සිදුවන ගැටළු මඟ හැරවීමට හැකි වන ආකාරයේ පිළියම් සහිත නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කිරීම.**

**VI.** **1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාරව නියෝජිතායතන විසින් විදේශගත කරනු ලබන විගමනිකයන්ගේ දත්ත ඇතුළත්ව පවත්වා ගෙන යන A,B,C,D යන පොත් හතර මාස 2ක කාලයක් ඇතුළත ඩිජිටල්ගත කොට කාර්යාංශයේ තොරතුරු පද්ධතියට උඩුගත කිරීමට පියවර ගැනීම.**

**VII.** **තාවකාලිකව තහනම් කර ඇති නියෝජිතායතන පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටින විදේශ සේවා නියුක්ති කාර්යාංශයට සම්බන්ධ සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම තුළින් රැකියා සඳහා එකී නියෝජිතායතන ඔස්සේ විදේශගත වීමට අපේක්ෂා කරන ශ්‍රමිකයන් හට එම තොරතුරු ලබා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කිරීම.**

**VIII.** **සංචාරක වීසා මත ශ්‍රමිකයන් විදේශගත කිරීම වෙනුවට රැකියා වීසා බල ගැන්වීමට කටයුතු කිරීම.**

**02.** <u>කුවේට් වන්දි අරමුදල් ගිණුම</u>

2025.02.27 දින ලබා දුන් කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බවත්, ඒ අනුව, රු. බිලියන 5.1ක කුවේට් වන්දි අරමුදල කොටස් දෙකකට බෙදා වෙන් කිරීමට අපේක්ෂිත බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

1. **රු. බිලියන 3ක්:** හෝමාගම පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් සහ අම්පාරේ විගමනික සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීම ඇතුළු පුහුණු වැඩසටහන් සඳහා යෙදවීමට තීරණය කර ඇත.

2. **රු. බිලියන 2.1ක්:** වයස අවුරුදු 60 සම්පූර්ණ කළ විගමනික ගෘහ සේවිකාවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කිරීමට යොදවනු ඇත.

මීට අමතරව, සමාජ ආරක්ෂණ මණ්ඩලය සමඟ එක්ව වයස අවුරුදු 60 ඉක්මවූ පසු ගෘහ සේවිකාවන්ට මසකට රු. 20,000ක විශ්‍රාම වැටුපක් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බවත්, මෙම වැඩසටහනට වාර්ෂිකව රු. බිලියන 1ක් භ්‍රමණ අරමුදලකට (Revolving Fund) සහ දායකත්ව විශ්‍රාම වැටුපෙන් 20% ක් ද ලබා දීමට අපේක්ෂිත බවත්, මෙම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් කාරක සභාවට අනාවරණය විය.

තවද, රු. බිලියන 18ක ස්ථාවර තැන්පතු කාර්යාංශය සතුව පවතින බව නිරීක්ෂණය විය.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

**2025 – 2030 දක්වා වූ කාල පරිච්ඡේදයට ආයතනය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමේදී කුවේට් වන්දි අරමුදල සහ කාර්යාංශයේ ඇති අනෙකුත් අරමුදල් උපයෝජනය කිරීමේ වැඩසටහන් එයට ඇතුළත් කිරීම.**

## 03. <u>රටවිරුවෝ නිවාස ණය වැඩසටහන</u>

**2013 ජනවාරි 24** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ රටවිරුවෝ නැමැති නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර **05**ක අවබෝධතා ගිවිසුමක් කාර්යාංශය විසින් අත්සන් කරන ලදී. මෙම ගිවිසුම යටතේ, කාර්යාංශය විසින් **2013 මාර්තු 08** වැනි දින සමෘද්ධි අධිකාරිය වෙත රුපියල් මිලියන **100**ක මුදලක් අදාළ ණය යෝජනා ක්‍රමය සඳහා සුරැකුම් ලෙස තැන්පත් කරන ලදී.

ණය වැඩසටහන අවසන් වූ පසු එම මුදල හා සමුච්චිත පොළිය කාර්යාංශයට ලැබිය යුතු බව කාරක සභාවට නිරීක්ෂණය විය.

කෙසේවෙතත්, **2018 මාර්තු 07** වැනි දිනෙන් පසුව මෙම ගිවිසුමේ වලංගු භාවය අවසන් වූ නමුත්, වැඩසටහන යටතේ ණය ලබා දීම පිළිබඳ කිසිදු තොරතුරක් කාර්යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණු බවත්, **2024 දෙසැම්බර් 31** වන විට, මෙම මුදල සමුච්චිත පොළිය සමඟ රුපියල් මිලියන **341.7** දක්වා වර්ධනය වී තිබුණු බවත් කාරක සභාවට අනාවරණය විය.

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් ලක්ෂ **3** බැගින් විදෙස්ගත ශ්‍රමිකයන් **12,000**කට පමණ ණය ලබා දීම අපේක්ෂා කර තිබුණු බවත්, ණය ලබා ගත් පුද්ගලයන්ගේ විස්තර සමෘද්ධි අධිකාරියෙන් ලබා ගැනීමට කාර්යාංශය අපොහොසත් වී ඇති බවත්, අවබෝධතා ගිවිසුමට අනුව ස්ථාපිත කළ යුතු වූ ව්‍යාපෘති සම්බන්ධීකාරක කමිටුවක් ද පත්කර නොතිබුණු බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

**2025 අප්‍රේල් 10** වැනි දින පවත්වන ලද සාකච්ඡාවකදී, සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය රුපියල් මිලියන **341.7**ක මුදල කාර්යාංශයට නිදහස් කිරීමට එකඟ වී ඇති බව කාරක සභාවට අනාවරණය විය.

කෙසේ වුවත්, **2013** සිට **2018** දක්වා කාලය තුළ කාර්යාංශය විසින් අදාළ ණය වැඩසටහන පිළිබඳ කිසිදු ඵලදායී අධීක්ෂණයක් හෝ සොයා බැලීමක් නොකිරීම සහ වැඩසටහන අවසන් වී වසර **7**කට ආසන්න කාලයක් ගතවී තිබියදීත් සුරැකුම් ලෙස ලබා දුන් මුදල් ආපසු ලබා ගැනීමට අපොහොසත් වීමත්, අදාළ මුදල සමෘද්ධි අධිකාරියේ නමින් තැන්පත් කිරීමත් කාරක සභාවේ විවේචනයට ලක්විය.

රටවිරුවෝ නිවාස ණය වැඩසටහනේ සියලුම තොරතුරු එනම්, වැඩසටහන යටතේ ණය ලබාගත් ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය සහ එක් එක් ප්‍රතිලාභියාට ලබා දෙන ලද ණය මුදල් ප්‍රමාණයන්, අදාළ වැඩසටහන මූල්‍යනය කළ අරමුදල් මූලාශ්‍රයන්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ කාර්යාංශය එළඹෙන ලද අවබෝධතා ගිවිසුම අනුව, නිවාස ණය වැඩසටහන සඳහා ඇපයක් වශයෙන් කාර්යාංශය විසින් ලබා දෙන ලද රුපියල් මිලියන 100 ස්ථාවර තැන්පතුවේ පොළිය, පවතින ශේෂය ආදී සියලුම තොරතුරු, රටවිරුවෝ නිවාස ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළව වගකීම් දරන ලද නිලධාරීන්ගේ නම් ඇතුළු සමස්ථ තොරතුරු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් පිළියෙල කොට කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නිර්දේශය කළ අතර ඒ අනුව අදාළ වාර්තාව 2025.06.27 දිනැතිව කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

**04.** **<u>දකුණු කොරියාව බලා ගමන් කළ ශ්‍රමිකයන් 6 දෙනෙකු සඳහා කාර්යාංශය විසින් වැඩි මුදලක් ගෙවා ගුවන් ටිකට් පත් මිලදී ගැනීමට කටයුතු කිරීම</u>**

**2023 ජූලි 25** වැනි දින දකුණු කොරියාව බලා පිටත්ව යාමට නියමිතව සිටි **ශ්‍රමිකයින් 6** දෙනෙකුට ගුවන් ටිකට්පත් මිලදී ගැනීමේදී ඇති වූ ගැටලුවක් හේතුවෙන් ඔවුන්ගේ ගමන අත්හිටුවා තිබීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. මෙම ශ්‍රමිකයින් ටිකට්පත් **5**ක් රු. **279,000** ක් බැගින් සහ තවත් එක් ටිකට්පතක් රු. **272,000** කට ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් පෞද්ගලිකව මිලදී ගෙන තිබුණද විදේශ රැකියා ඒජන්සි සමාගමෙන් එම ටිකට්පත් **රු.319,522** ක මිලකට මිලදී

නොගැනීම හේතුවෙන් එදින ඔවුන්ට කොරියාව බලා පිටත්ව යාම අත්හිටුවීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

මේ හේතුවෙන් එක් ශ්‍රමිකයෙකු නැවත රු. **319,522** ක් ගෙවා එදිනම ගමන් කිරීමට හැකි වූ බවත්, ඉතිරි **5** දෙනා මාසයකට පසුව ටිකට්පතකට රු. **329,291** ක් බැගින් ගෙවා නැවත ටිකට්පත් මිලදී ගැනීමට සිදු වී ඇති බවත්, ශ්‍රමිකයන් **6** දෙනාටම ටිකට්පත් සඳහා සම්පූර්ණයෙන් රුපියල් මිලියන **1.9** කට අධික මුදලක් වැය වූ බවත්, ඔවුන් පෞද්ගලිකව මිලදී ගත් මුල් ටිකට්පත් අවලංගු කිරීමෙන් ලැබිය යුතු මුදල් ලැබී ඇත්දැයි විගණනයෙන් තහවුරු වී නොතිබුණු බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

**2012** දී කොරියාව සමඟ ඇති කරගත් ගිවිසුම අනුව, ශ්‍රමිකයින් කණ්ඩායම් වශයෙන් සහ නිල නියෝජිතායතනයක් හරහා ගමන් කළ යුතු වුවද, **2020 ජූලි 15** වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය පුද්ගලික ටිකට් මිලදී ගැනීමට අවසර දුන් බවත්, **2023 අප්‍රේල් 6** වැනි දින නැවතත් එම තීරණය වෙනස් කර කණ්ඩායම් වශයෙන් මිලදී ගැනීමට නියම කරන ලද බවත්, මෙම නිතර වෙනස් වන ප්‍රතිපත්ති හේතුවෙන් ශ්‍රමිකයින් අතර ව්‍යාකූලත්වයක් ඇති වූ බවත් කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

කෙසේ වුවද, විදේශ සේවා නියුක්ති නියෝජිතායතනය මගින් කණ්ඩායම් වශයෙන් ගුවන් ටිකට් පත් ලබාගත යුත්තේ කොරියාවට සෘජු ගුවන් ගමනකින් ප්‍රථම වරට රැකියාවට යන ශ්‍රමිකයන් සඳහා පමණක් වන අතර, දෙවන වරට කොරියාවට යන අත්දැකීම් ඇති ශ්‍රමිකයන්ට සිංගප්පූරුව හරහා පුද්ගලිකව ගුවන් ටිකට් පත් මිලදීගෙන ගමන් කළ හැකි බව කාරක සභාවට අනාවරණය විය. ඒ අනුව කොරියාවට ගමන් කිරීම සඳහා ගුවන් ටිකට් පත් ලබාගැනීමේ ක්‍රම දෙකක් පවතින බවත්, ඒ පිළිබඳ ශ්‍රමිකයන්ට නිසි දැනුවත් කිරීමක් හෝ අදාළ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පැහැදිලි නියාමනයක් කාර්යාංශය මගින් සිදුකර නොමැති බවත් කාරක සභාව අවධාරණය කළේය.

## 05. දකුණු කොරියාවේදී අනතුරට පත් ශ්‍රී ලාංකික ශ්‍රමිකයෙක් මෙරටට ගෙන්වා ගැනීමේ ක්‍රියාවලිය

2019 ඔක්තෝබර් මස 08 වැනි දින දකුණු කොරියාවේදී අනතුරකට පත් වූ ධීවර අංශයේ ශ්‍රමිකයෙකු මෙරටට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් කාරක සභාව අවධානය යොමු කළාය.

ඔහුගේ සහෝදරයා විසින් කාර්යාංශයේ රු.1,564,546 ක මුදලක් තැන්පත් කර තිබියදී, කම්කරු සුභසාධන අංශයේ නිලධාරියෙකු විසින් අදාළ සේවකයා ශ්‍රී ලංකාවට නැවත එවීමට හා රෝහල් බිල පියවීම සඳහා සේවකයාගේ එරට ගිණුමේ මුදල් භාවිතා කර තිබූ බවත්, තවත් නිලධාරියෙක් ණය කාඩ්පතක් භාවිත කර ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සිදු කොට ඇති බවත්, 2023 අගෝස්තු මාසයේදී වියදම් පරීක්ෂා කිරීමකින් තොරව ඉතිරි වූ රු.98,786 ක් පමණක් අදාළ සේවකයාගේ සහෝදරයාට ගෙවා ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

සිද්ධිය වූ අවස්ථාවේ සේවකයා සතුව මුදල් නොතිබූ බවත්, පළමු රෝහල් බිල වූ කොරියානු වොන් 170,000 සේවායෝජකයා ගෙවූ බවත්, දෙවන බිල වූ වොන් මිලියන 5 කාර්යාංශය විසින් සාකච්ඡා මාර්ගයෙන් මිලියන 1.8 දක්වා අඩු කරගත් බවත් අනාවරණය විය. ඉහත අවස්ථා දෙකකදීම සේවකයාගේ ගිණුමෙන් මුදල් ලබාගෙන නොමැති බව කාර්යාංශයට තහවුරු කළ හැකි විය. සේවකයා ආපසු ශ්‍රී ලංකාවට යැවීමේ ගුවන් ගමන් ගාස්තුව පියවා ඇත්තේ සහෝදරයා තැන්පත් කළ මුදල්වලින් බවත්, රු.98,000 ක පමණ හිඟ මුදලක් තවමත් පියවීමට කටයුතු කරමින් පවතින බවත් අනාවරණය විය.

විදේශගත සේවකයෙකු අනතුරකට ලක් වූ විට ඒ සඳහා වන වියදම් පියවා ගැනීමට පැහැදිලි ක්‍රියා පටිපාටියක් පවතී. එහිදී ප්‍රථමයෙන් අදාළ වියදම් පියවන ලෙස සේවායෝජකයා වෙත යොමු කරන අතර, එය කළ නොහැකි අවස්ථාවලදී ආපසු ගෙවීමේ පදනම මත ක්‍රියාත්මක වන රක්ෂණ ක්‍රමවේද භාවිතා කරනු ලබයි. යම් හෙයකින් සේවකයා කොරියාව බලා පිටත්ව ගොස් ඇත්තේ නියෝජිතායතනයක් හරහා නම් එම වියදම් සඳහා සහාය වන ලෙස එම ආයතනයට දැනුම් දෙන අතර, අනෙකුත්

සියලු විකල්ප අසාර්ථක වුවහොත් පමණක් ඉතිරි වියදම් පියවා ගැනීමට සේවකයාගේ පවුලෙන් ඉල්ලීමක් කරනු ලැබේ. එම උත්සාහයන්ද ව්‍යර්ථ වුවහොත් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කම්කරු සුබසාධන අරමුදල මඟින් අදාළ පිරිවැය දරනු ලබයි. එහිදී පූර්ණ ආබාධිත තත්ත්වයකදී හෝ මරණයකදී රුපියල් ලක්ෂ 6ක උපරිමයකට යටත්ව රක්ෂණ වන්දි මුදලක් ලබා දීමේ ක්‍රමවේදයක්ද පවතී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. ශ්‍රමිකයා ශ්‍රී ලංකාවට ආපසු එවීමේ කටයුතු සඳහා ශ්‍රමිකයාගේ බැංකු ගිණුමෙන් මුදල් වියදම් කොට නැති බව තහවුරු කරමින් කොරියානු බැංකුවෙන් ලැබෙන ලිපිය කාරක සභාවට ඉදිරිපත් කිරීම.**

**II. ආයතනයේ නියාමන කාර්යභාරයේ කොටසක් ලෙස විගමනික සුබසාධන වැඩසටහන පුළුල් කිරීමේදී විගමනික සේවකයන් අනතුරකට භාජනය වීමකදී ප්‍රතිකාර ලබා දීම සහ ආපසු ලංකාවට ගෙන්වා ගැනීමේ වියදම් කාර්යාංශයේ කම්කරු සුබසාධන අරමුදල මාර්ගයෙන් දැරීම පිළිබඳව අවධානය යොමු කර ඒ වෙනුවෙන් සකස් කරන නිශ්චිත වැඩ පිළිවෙල සම්බන්ධයෙන් කාරක සභාව දැනුවත් කිරීම.**

**06. <u>කාර්යාංශයට අයත් ඕමාන් තානාපති කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ සුරක්ෂා නිවාසයක් පවත්වා ගෙන යාමේ හැකියාව තිබියදී ඒ සඳහා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි භාවිතා කිරීම.</u>**

ඕමාන් තානාපති කාර්යාල ගොඩනැගිල්ලේ සුරක්ෂා නිවාසයක් පවත්වාගෙන යාමේ හැකියාව තිබියදී, 2019 ඔක්තෝබර් 01 දින සිට 2024 ජූලි දක්වා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි සඳහා 2024 ජනවාරි දක්වා ඕමාන් රියාල් 34,000ක් හෙවත් රු.28,561,112ක මුදලක් වැය කර ඇත. තවද, 2022 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළ රඳවියන් සුරක්ෂා නිවාසයට සිදුකළ අලාභහානි හේතුවෙන්, 2023 පෙබරවාරි සිට අගෝස්තු දක්වා මාස 7ක ප්‍රමාද ගාස්තු ලෙස රු.4,948,972ක් ද, බිල්පත්

සඳහා රු.1,102,902ක් සහ අලුත්වැඩියා සඳහා රු.13,078,594ක් වශයෙන් එකතුව රු.19,130,480ක මුදලක් ගෙවා තිබේ.

සුරක්ෂිත නිවාසයේ නවාතැන් ධාරිතාව දස දෙනෙකුට සීමා වුවද, එම ධාරිතාවය ඉක්මවා සංචාරක වීසා මත විදේශගත වූ ශ්‍රමිකයන්ටද නවාතැන් ලබා දී ඇති බවත්, මෙම තදබදය හේතුවෙන් අමතර නිවසක් කුලියට ගැනීමට සිදුවී ඇති බවත් නිරීක්ෂණය විය.

1985 අංක 21 දරන පනතේ 53 (3) වගන්තිය අනුව සෑම ශ්‍රමිකයෙකුම ලියාපදිංචි විය යුතු අතර, එසේ නොවන අයට කාර්යාංශ අරමුදල් වැය කිරීම නීති විරෝධී බැවින් වර්තමානයේ ලියාපදිංචි ශ්‍රමිකයන්ට පමණක් නවාතැන් දීමට චක්‍රලේඛ නිකුත් කර ඇත.

කෙසේ වෙතත්, නීති විරෝධී ලෙස විදේශගත වීමේ ක්‍රමවේද පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා අනීතිකව විදේශගත වූ ශ්‍රමිකයන් පිළිබඳ දැනුවත් වීම වැදගත් බවත්, නීත්‍යානුකූල විදේශගත වීමේ ක්‍රමවේද පිළිබඳ ජනතාව දැනුවත් කිරීම කාර්යාංශයේ මූලික කාර්යභාරයක් බවත් කාරක සභාව අවධාරණය කරන ලදී.

## 07. <u>රුපියල් මිලියන 63.3ක් වැය කොට "විගමනික හරසර" වැඩසටහන පැවැත්වීම සහ රුපියල් බිලියන 1.259ක් වැය කොට "Glocal fair" ( ජයගමු ශ්‍රී ලංකා) වැඩසටහන පැවැත්වීම</u>

කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද "විගමනික හරසර" සහ "ජයගමු ශ්‍රී ලංකා" (ග්ලෝකල් ෆෙයා) නම් වැඩසටහන් දෙකක් පිළිබඳව කාරක සභාවේ දැඩි අවධානය යොමු විය.

<u>"විගමනික හරසර" වැඩසටහන</u>

මෙම වැඩසටහන කාර්යාංශයේ 2024 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූවකි. පළාත් මට්ටමේ රැස්වීම් 03ක් සඳහා විගමනික සංගම් සාමාජිකයන් 5000ක් ඇතුළත් කරගනිමින් මෙම

වැඩසටහන පැවැත්වුණි. 2024 ජූලි 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව, Selacine Media Solution (Pvt.) Ltd ආයතනයට සෘජු ප්‍රසම්පාදනයක් මගින් වැඩසටහන පවත්වීමට අනුමැතිය ලබා දෙන ලදී. 2024 ජූලි 17 දිනැති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව රු.63,362,242ක මුදලක් 2024 ජූලි 18 සහ අගෝස්තු 03 යන දිනවලදී කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශයට ලබා දෙන ලදී. මෙම මුදලින් සුබපැතුම්පත් 03 සඳහා රු.1,935,000ක්, විගමනික ශ්‍රමිකයන් ප්‍රවාහනය සඳහා රු.8,230,375ක් සහ ශාලා සකස් කිරීම හා ආහාරපාන සඳහා රු.62,756,542ක් වැය කරන ලදී. එසේ වුවත් මෙම වියදමින් ශ්‍රමිකයන්ට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොමැති බවත්, එය අනාර්ථික වියදමක් ලෙස විගණනයේදී හඳුනාගන්නා ලද බවත් කාරක සභාවට අනාවරණය විය.

<u>ජයගමු ශ්‍රී ලංකා" (Glocal Fair) වැඩසටහන් මාලාව</u>

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතන විසින් සපයනු ලබන සේවාවන්, සේවාලාභින් පදිංචි ස්ථානවලදී පහසුවෙන් ලබාගත හැකිවන පරිදි දිවයින පුරා "Glocal Fair" (ජයගමු ශ්‍රී ලංකා) නමින් ජංගම සේවා මාලාවක් පවත්වා තිබුණි. ජංගම සේවා මාලාව සඳහා, 2020 මාර්තු 25 දිනැති අංක 35 මගින් සංශෝධිත 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 පරිච්ඡේදයට පටහැනිව සැපයුම්කරුවකු තෝරාගෙන රු.542,800,000ක් ගෙවා තිබුණි. 2024 ජනවාරි 31 සිට අගෝස්තු 17 දක්වා දිස්ත්‍රික්ක 24ක් ආවරණය කරමින් සතියකට වරක් වැඩසටහන් 24ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, ඉතා හදිසි ලෙස සලකා කිසිදු සැලසුමකින් තොරව එම වැඩසටහන 2024 ජූලි 28 වන විට අවසන් කොට ඇත. කාර්යාංශයේ 2024 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ මෙම වැඩසටහන අඩංගු වී නොතිබිණි. කෙසේ වුවද, බලපත්‍රලත් විදේශ සේවා නියුක්ති නියෝජිතායතන 115ක් මෙම වැඩසටහනට සහභාගී වී තිබූ අතර සමස්ථ වැඩසටහන වෙනුවෙන් රු.1,259,752,579ක් මුදලක් වැයවී තිබිණි. රැකියා අවස්ථා වැඩි කිරීමේ අරමුණින් මෙම වැඩසටහන් මාලාව පවත්වා තිබුණද, 2025 පෙබරවාරි 25 වන විටත් නියෝජිතායතන 28ක් මගින් ශ්‍රමිකයන් 336ක් පමණක් විදේශගත කොට ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

'ජයගමු ශ්‍රී ලංකා' (ග්ලෝකල් ෆෙයා) වැඩසටහන 2022 ඔක්තෝබර් මස ගාල්ල දිස්ත්‍රික්කයෙන් ආරම්භ විය. 2023 ජූනි මස එය යාපනයේ පවත්වන ලදී. අනෙකුත් දිස්ත්‍රික්ක 23 හි අදාළ වැඩසටහන 2024

ජනවාරි 31 වැනි දින සිට ජූලි 28 වැනි දින දක්වා ක්‍රියාත්මක විය. ගාල්ලේ සහ යාපනයේ වැඩසටහන් සඳහා රන්දීප මීඩියා ප්‍රයිවට් ලිමිඩට් ආයතනයෙන් ද, අනෙක් දිස්ත්‍රික්ක සඳහා සැර අයිඩියා ආයතනයෙන් ද වෙළඳ කුටි කුලියට ගෙන ඇති නමුත්, මෙම ආයතන දෙකෙහිම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් එකම පුද්ගලයන් බව නිරීක්ෂණය විය. ගාල්ලේ පැවති වැඩසටහනේදී වෙළඳ කුටියක් සඳහා රු.170,000 ක් වැය කර තිබුණද, අනෙක් සෑම දිස්ත්‍රික්කයකදීම එකම ප්‍රමාණයේ කුටියක් සඳහා රු.500,000 බැගින් වැය කර තිබූ බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

සමස්ථ වැඩසටහනට වැය වූ රු. මිලියන 1,259 ක මුදලින් රු. මිලියන 560 ක් වෙළඳ කුටි සඳහා ද, ඉතිරි රු.මිලියන 699 සුබසාධන වැඩකටයුතු (විගමණික ශ්‍රමිකයන්ගේ දරුවන්ට පාසල් උපකරණ, ශිෂ්‍යත්ව ආදිය ලබා දීම) සහ අනෙකුත් වියදම් සඳහා ද යොදාගෙන තිබිණි. කෙසේ වුවද වැඩසටහන සඳහා අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත්තේ වැඩසටහන ක්‍රියාත්මක වෙමින් තිබියදී, එනම් 2024 මාර්තු 12 වැනි දින බව නිරීක්ෂණය විය. නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකිරීම සහ වැඩසටහනේ අරමුණු ඉටු වී නොමැතිවීම හේතුවෙන් වියදම් සාධාරණීකරණය කළ නොහැකි බවත් කාරක සභාවට නිරීක්ෂනය විය.

විගමනික ශ්‍රමිකයන්ගේ සුබසාධනය සඳහා යෙදවිය හැකිව තිබූ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සතු අරමුදල්, දේශපාලන ව්‍යාපෘතියක් සඳහා යොදා ගන්නා ලද ආකාරයක් පැහැදිලිව අදාළ වැඩසටහන තුළින් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

## 08. <u>ඇතැම් විදේශ රැකියා නියෝජිතායතන විසින් විගමනික ශ්‍රමිකයන් කාර්යාංශයේ ලියාපදිංචි කිරීමේදී සිදු කරන වංචාව</u>

කාරක සභාව විසින් එස්.එස්.පී.එල්. විදේශ රැකියා නියෝජිතායතනයේ හිමිකරු විජය උඩුපිටිය මහතා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 120(6) යටතේ කැඳවා තිබිණි. ඔහු සතුව ඇතැයි පවසන වංචාවක් පිළිබඳ

තොරතුරු කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභා සභාපතිවරයා දැනුම් දුන්නේය.

සෑම විගමනික ශ්‍රමිකයෙක්ම කාර්යාංශයේ ලියාපදිංචි වීමේදි යම් කිසි ගාස්තුවක් ගවෙන බවත්, අදාළ රැකියාව සොයා දෙනු ලබන්නේ විදේශ රැකියා නියෝජිතායතනයකින් නම් එම ලියාපදිංචි ගාස්තුවෙන් 70%ක මුදලක් ආපසු අදාළ නියෝජිතායතනයට ගෙවනු ලබන බවත් අනාවරණය විය. පුද්ගලික මාර්ගවලින් රැකියා සොයා විදේශගත වූ ශ්‍රමිකයන්ගේ තොරතුරු, කූට ලේඛන මගින් නියෝජිතායතන මාර්ගයෙන් ගිය අය ලෙස සටහන් කර, ඔවුන් විසින් කාර්යාංශයට ගෙවන ලද ලියාපදිංචි ගාස්තුවෙන් 70% ක මුදල නියෝජිතායතන විසින් ලබා ගත් බව විජය උඩුපිටිය මහතා චෝදනා කළේය. මෙම වංචාව හේතුවෙන් 2013 සිට 2024 දක්වා කාලය තුළ රජයට රුපියල් බිලියන 1.8ක ආදායමක් අහිමි වී ඇති බවත් ඔහු ප්‍රකාශ කළේය.

ඔහු තවදුරටත් පෙන්වා දුන්නේ, 2015-2017 සමයේ මෙම වංචනික ක්‍රියාව නීතිගත කරමින් නියෝජිතායතන 3කට රහසිගත චක්‍රලේඛයක් නිකුත් කිරීම මඟින් අවසර ලබා දී ඇති බවත්, රේඛීය අමාත්‍යාංශය විසින් එම වංචනික ආයතනවලට ඇගැයීම්ද ලබාදී ඇති බවත්ය. ඔහු 2019 දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට මේ සම්බන්ධව පැමිණිල්ලක් කොට ඇත. මෙම පැමිණිල්ල කොමිෂන් සභාවේ නීති අංශයට යොමු කර ඇති බව මේ සම්බන්ධයෙන් 2023 වර්ෂයේදී සිදුකරන ලද පසුවිපරමකදී මොහුට දැනගන්නට ලැබී ඇත.

මෙම වංචාව පිළිබඳව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්වරයාට පැමිණිලි කළ බවත්, ඒ අනුව අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් පරීක්ෂණයක් කර ඇති බවත් උඩුපිටිය මහතා සඳහන් කළේය. එම පරීක්ෂණයේ නිර්දේශයට අනුව අදාළ නියෝජිතායතන තුනෙන් රුපියල් මිලියන 123ක මුදලක් අය කර ගත යුතු වුවද, අමාත්‍යාංශය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්, මෙම වංචනික ක්‍රියාමාර්ගය සඳහා කාර්යාංශයේ අභ්‍යන්තර සහයෝගයක් පැවති බවත් උඩුපිටිය මහතා ප්‍රකාශ කරන ලදී.